**සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගමේ 2018 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 06 සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 06 සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 සැප්තැම්බර් 30 දිනෙන් මාස 06 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2018 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 06 සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකි ය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 "තොග" හි 09 ඡේදය ප්‍රකාරව තොගවල අගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත අගය කළ යුතු වුවත් 2018 සැප්තැම්බර් 30 දිනට සමාගමේ අවසාන තොගය තුළ වූ ශුද්ධ උපලබ්ධි අගය රු. 798,000 ක් වූ පොලිප්ටෝ තෙල් ලීටර් 22,800 ක් එහි පිරිවැය වූ රු. 1,310,588 පදනම් කරගෙන ගිණුම්ගත කර තිබීම හේතුවෙන් 2018 සැප්තැම්බර් 30 දිනට ජංගම වත්කම්වල වටිනාකම රු. 512,588 කින් වැඩියෙන් ද කාලපරිච්ඡේදයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | නව නිමැවුම්කරු වෙත පවරා දීමට පෙර ඉන්ධන තොගය අලෙවි කිරීම සඳහා දැන්වීම් මගින් මිල කැඳවන ලදී. ලීටරයක මිල රු. 35 බැගින් මුලු තොගයම මිලදී ගැනීමට ගැණුම්කරුවකු ඉදිරිපත් වුවද එම තොගයේ කොටසක් ඉවතට ගැනීමට නොහැකි පරිදි තැන්පත් වී තිබුණි. ඒ අනුව ලීටර් 22,800 ක් ඉවත් කිරීමට නොහැකි විය. මෙහි නිෂ්පාදන පිරිවැය රු. 1,310,588 ක් විය. මෙම තත්ත්වය සලකා බලා ශුද්ධ උපලබ්දි අගය ලෙස රු. 35 ක් වූ මිල සලකා බැලීම සිදු නොකරන ලද අතර නිෂ්පාදන පිරිවැය මත තොගය ආගණනය කරන ලදී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 ඡේදය ප්‍රකාරව තොගවල අගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත අගය කළ යුතු වේ. |
| (ආ) පිරිවැය රු. 3,988,565 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 53 ක් සම්පූර්ණයෙන් ම ක්ෂය කර ඇතත් ,තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි .එහෙත් අදාල වත්කම් දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16- හි 51 ඡේදය ප්‍රකාරව ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිණුම් තැබීමේ දී මෙම කරුණ සලකා බලා සුදුසු ක්‍රමවේදයක් යටතේ ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16- හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර ඒ අනුව වන ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මෙවලම් හා උපකරණ යටතට ගැනෙන පිරිවැය රු. 885,843 ක් වූ වත්කම් අයිතම 07 ක්, සමාගමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුව වාර්ෂිකව පිරිවැය මත සියයට 10 ක් හෙවත් රු. 44,292 ක් ගිණුම් කාලපරිච්ඡේදයට අදාලව ක්ෂය කළ යුතු වුවත්, වැරදීමකින් සියයට 20 ක් හෙවත් රු. 88,582 ක් ක්ෂය කර තිබුණි. ඒ අනුව 2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ ශුද්ධ අලාභය රු. 44,290 ක් වැඩියෙන් ද එදිනට ජංගම නොවන වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වාර්ෂික පදනමින් ක්ෂය ගණනය කර ඇති බැවින් මෙම දෝෂය සිදු වී ඇත. ප්‍රමාද දෝෂයකින් මාස හයක් පමණක් සඳහා ක්ෂය ගණනය කිරීම අතපසු වී ඇත. | සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය ප්‍රතිපාදනය කළ යුතුය. |

## 1.6 සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 සැප්තැම්බර් 30 දිනට ශුද්ධ අගය ශුන්‍ය වූ, තක්සේරු වෙළඳපොල වටිනාකම රු. 1,250,000 ක් වන මෝටර් වාහනයක්, ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2018 සැප්තැම්බර් 27 දිනැති ලිපිය මගින් නව නිමැවුම්කරු වෙත පවරා දී තිබුණි. මෙම වත්කම මෙහෙයුම් හා නඩත්තු කටයුතු පිළිබඳ ගිවිසුමෙන් ආවරණය වන තක්සේරු වටිනාකම රු. 82,019,500 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 16 තුළ ඇතුලත් නොවන බව නිරීක්ෂණය කරන අතර, එය පවරා දීම සම්බන්ධයෙන් උප ගිවිසුමකට එළඹ නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | රථ වාහන තක්සේරු කිරීම, රජයේ තක්සේරුකරු විසින් නොකරන බව දැනුම් දී ඇති අතර මෙම රථය ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් ඇසෝසියේට් ආයතනය විසින් තක්සේරු කරන ලදී. ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPRD/ADM/12/4/5 හා 2018.09.27 දින දරන ලිපියෙහි සඳහන් උපදෙස් අනුව මෙකී වාහනය ද අදාළ තක්සේරු වාර්තාව සමග නව නිමැවුම්කරු වෙත 2018.09.30 දින පවරා දෙන ලදී. | නව නිමැවුම්කරු වෙත පවරා දී ඇති සියළුම වත්කම්වල වටිනාකම් ආවරණය වන පරිදි ගිවිසුම් වලට ඇතුළත් විය යුතුය. |
| (ආ) ඉහත ස්ථාවර වත්කම්වලට අමතරව 2018 සැප්තැම්බර් 30 දිනට පිරිවැය රු. 1,606,824 ක් වූ පාරිභෝගික ද්‍රව්‍ය | ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPRD/ADM/12/4/5 හා | නව නිමැවුම්කරු වෙත පවරා දී ඇති සියළුම වත්කම්වල |

| | | |
|---|---|---|
| තොගයක් හා පිරිවැය රු. 2,163,178 ක් වූ නියමු ව්‍යාපෘතියේ අමතර කොටස් තොගයක් ද නව නිමැවුම්කරු වෙත පවරා දී තිබුණි. නමුත් නව නිමැවුම්කරු විසින් නැවත පියවිය යුතු රු. 82,019,500 ක් වූ වටිනාකම තුළ එකතුව රු. 3,770,002 ක් වූ මෙම තොගයන්හි පිරිවැය ඇතුළත්ව නැති බව නිරීක්ෂණය විය. | 2018.09.27 දින දරන ලිපියෙහි සඳහන් උපදෙස් පරිදි 2018.09.30 දිනට සමාගම් පරිශ්‍රයේ තිබූ සියළුම අමුද්‍රව්‍ය, නිමි ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය තොග සහ සියලුම ලිපිගොනු නව නිමැවුම්කරු වෙත ලිඛිතව භාර දෙන ලදී. | වටිනාකම් ආවරණය වන පරිදි ගිවිසුම් වලට ඇතුළත් විය යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික** සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 156 (7) හා 780 | ගෙවීම් සම්බන්ධව කටයුතු කරන නිලධාරින් ගෙවීම් සිදු කිරීමේ දී නිසි විචක්ෂණභාවයෙන් සැලැසුම්කර, කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් කටයුතු කළ යුතු වුවද, 2018 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයට අදාල බදුකුලිය නියමිත දිනට නොගෙවීම හේතුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට රු. 79,115 ක් ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් නිසි පරිදි බැර නොකිරීම හේතුවෙන් රු. 1,390 ක් ද, වශයෙන් රු. 80,505 ක් දඩ මුදල් ලෙස ගෙවීමට සිදු වී තිබුණි. | භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම නිසා මෙම බදුකුලිය හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාද වීමෙන් මෙම ප්‍රමාද ගාස්තුව ගෙවීමට සිදු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 395 | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින් ම එක් | 2018 අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස වල | මුදල් රෙගුලාසි |

| | | | |
|---|---|---|---|
| | එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවත්, 2018 අප්‍රේල් සිට සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 06 ට අදාලව අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | ගණුදෙනු සිදු නොවූ බැවින් එම මාස සඳහා වෙනම බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 06 හි මෙහෙයුම් ප්‍රතිඵලය රු. 10,025,887 ක පාඩුවක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 22,392,638 ක් විය.